**අ. පො. ස. (උසස් පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014**
**21 - ආර්ථික විද්‍යාව - I පත්‍රය (බහුවරණ)**
**පිළිතුරු සඳහා මග පෙන්වීම**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 4 |
| 4 | 1 |
| 5 | 3 |
| 6 | 3 |
| 7 | 3 |
| 8 | 3 |
| 9 | 5 |
| 10 | 4 |
| 11 | 1 |
| 12 | 4 |
| 13 | 5 |
| 14 | 3 |
| 15 | 2 |
| 16 | 3 |
| 17 | 3 |
| 18 | 5 |
| 19 | 2 |
| 20 | 4 |
| 21 | 1 |
| 22 | 3 |
| 23 | 3 |
| 24 | 4 |
| 25 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 26 | 2 |
| 27 | 5 |
| 28 | 2 |
| 29 | 5 |
| 30 | 2 |
| 31 | 2 |
| 32 | 4 |
| 33 | 3 |
| 34 | 1 |
| 35 | 2 |
| 36 | 5 |
| 37 | 4 |
| 38 | 1 |
| 39 | 4 |
| 40 | 5 |
| 41 | 2 |
| 42 | 4 |
| 43 | 5 |
| 44 | 4 |
| 45 | 1 |
| 46 | 1 |
| 47 | 2 |
| 48 | 4 |
| 49 | 3 |
| 50 | 5 |

ලකුණු 2 x 50 = 100

2 වන පිටුව බලන්න

# අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

## ආර්ථික විද්‍යාව II

## පිළිතුරු සඳහා මග පෙන්වීම

01. (i)

| නිර්ණායකය | ආර්ථික පද්ධතිය |
|---|---|
| 1. තීරණ ගැනීමේ හා තීරණ සම්බන්ධීකරණය කිරීමේ යාන්ත්‍රණය | 1. වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය<br>2. විධාන ආර්ථික ක්‍රමය<br>3. සාම්ප්‍රදායික ආර්ථික ක්‍රමය |
| 2. දේපළ සම්පත් අයිතියේ ස්වභාවය | 1. ධනවාදී ආර්ථික ක්‍රමය<br>2. සමාජවාදී ආර්ථික ක්‍රමය |
| 3. සානුබලවල ස්වභාවය | 1. සාම්ප්‍රදායික ආර්ථික ක්‍රමය<br>2. විධාන ආර්ථික ක්‍රමය<br>3. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය |

(ලකුණු 06)

(ii)
- සාම්ප්‍රදායික ආර්ථික පද්ධතියේ දී සම්ප්‍රදායන් හා සිරිත් විරිත් මුල් කර ගනිමින් නායකයාගේ හෝ නායකත්ව මණ්ඩලයේ මගපෙන්වීම පරිදි නිෂ්පාදිතය බෙදා හැරේ.
- විධාන ආර්ථික පද්ධතියක දී මධ්‍යගත සැලසුම් මණ්ඩලයේ තීරණ අනුව සමාජ ශුභ සාධනය උපරිම වන පරිදි නිෂ්පාදිතය සලාකනය කෙරේ.
- වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක දී සාධක වෙළෙඳපොළ හැසිරීම් මත ආදායම් බෙදීයන ආකාරය පදනම් කර ගනිමින් නිෂ්පාදිතය බෙදා හැරේ.

(ලකුණු 03)

(iii)




- යෙදවුම් අවශ්‍යතාව අඩුවීම, ඵලදායිතා වර්ධනයක් නිසා කාර්මික භාණ්ඩ දැක්වෙන අංශයෙන් පමණක් නිෂ්පාදන හැකියා මායිම් දකුණට විතැන් වේ.

රූප සටහනට ලකුණු 02
පැහැදිලි කිරීමට ලකුණු 02

(iv)
- මූලික ආර්ථික, ගැටළු විසදීම, මිල යන්ත්‍රණය හා රජයේ සැලසුම් යන්ත්‍රණය යන ක්‍රම දෙක මත සිදුවීම.
- දේපොළ හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතුව මෙන්ම රාජ්‍ය අංශය ද සතුව පැවතීම.
- පෞද්ගලික ව්‍යවසායකත්වය මෙන්ම රාජ්‍ය ව්‍යවසායකත්වය ද පැවතීම.
- පෞද්ගලික අංශය ස්වාර්ථය අරමුණෙන්ද, රාජ්‍ය අංශය වඩා පුළුල් අරමුණු ඇතිව ද කටයුතු කිරීම. එනම් ලාභය මෙන්ම සමාජ ශුභ සාධනය, සේවා නියුක්ති අවස්ථා උදා කිරීම, දේශපාලන අරමුණු ආදිය ඇතිව කටයුතු කළ හැකිය. (ලකුණු 03)

(v) මධ්‍යගත සැලසුම් අර්ථක්‍රමය ක්‍රියාත්මක වූ බොහෝ රටවල් එම ක්‍රමය අත්හැර වෙළෙඳපොළ ක්‍රමයට මාරු වී ඇති බව සත්‍යයකි. ඒ කෙරෙහි සමාජවාදී ක්‍රමයට ආවේනික වූ පහත සඳහන් දුබලතා හේතු විය.
සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත ගැටලු මතුවීම.
- නිලධාරිවාදය
- ආර්ථික නිදහස සීමාවීම
- පරිසරහායනයන්
- සානුබල ප්‍රමාණවත් නොවීම

(ලකුණු 04)

3 වන පිටුව බලන්න

02. (i) යම් නිශ්චිත අවස්ථාවක ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව පවතින විට සලකා බලනු ලබන භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ඇතිවන ප්‍රතිලෝම සම්බන්ධතාවය යි. (ලකුණු 02)

(ii) සලකා බලනු ලබන භාණ්ඩයේ මිලත් - ඉල්ලුම් ප්‍රමාණයත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින අවස්ථා කීපයකි.

- ගිෆන් භාණ්ඩ
- මිල මගින් වටිනාකම හුවාදක්වන භාණ්ඩ
- වත්කම් ප්‍රදර්ශණශීලී භාණ්ඩ (ලකුණු 02)

(iii) (අ) අත්‍යවශ්‍ය භාණ්ඩ
(ආ) සුඛෝපභෝගී භාණ්ඩ
(ඇ) ආදේශක භාණ්ඩ
(ඉ) අනුපූරක භාණ්ඩ (ලකුණු 04)

(iv) Qd = 600 - 10P
Qs = 10P




(සමතුලිතයට ලකුණු 02 යි. ප්‍රස්තාරය අවශ්‍යම නැත.)
(ලකුණු 02 යි)

$$Qd = Qs$$
$$600 - 10P = 10P$$
$$-10P - 10P = -600$$
$$\frac{-20P}{-20} = \frac{-600}{-20}$$
$$P = 30$$
$$Qd = 600 - 10P$$
$$Qd = 600 - 10 \times 30$$
$$Qd = 300$$
(ලකුණු 02)

(ii) පාරිභෝගික පැහැදම
රු 50 × 100 = රු 5000

ව්‍යාපාරික අයභාරය
රු 50 × 500 = රු 25000 (ලකුණු 02)

(iii) අවම මිලට පෙර = රු $\frac{30 \times 300}{2}$ = රු $\frac{9000}{2}$ = රු 4500

අවම මිලට පසු = රු $\frac{10 \times 100}{2}$ = රු $\frac{1000}{2}$ = රු 500

පාරිභෝගික අතිරික්තයේ වෙනස්වීම් = (500 - 4500) = - 4000 (ලකුණු 02)

(iv) අවම මිලට පෙර = රු $\frac{30 \times 300}{2}$ = රු $\frac{9000}{2}$ = රු 4500

අවම මිලට පසු = රු $\frac{50 \times 500}{2}$ = රු $\frac{25000}{2}$ = රු 12500

නිෂ්පාදක අතිරික්තයේ වෙනස්වීම් = (12500 - 4500) = රු 8000 (ලකුණු 02)

(v) අතිරික්තය මිල දී ගැනීමට ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය = රු 50 x 400 = රු 20000 (ලකුණු 02)

(vi) අහිමි වූ සමාජ ශුභ සාධනය

අවම මිල ප්‍රතිපත්තිය නිසා ආර්ථික අතිරික්තයේ ඇතිවන වෙනස්වීම් = (රු 8000 - රු 4000)
= රු 4000

අතිරික්තය මිල දී ගැනීමට ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය = රු 20000

අහිමි වන ශුභ සාධනය = රු (4000 - 20000)
= රු 16000 (ලකුණු 02)

(මුළු ලකුණු 2 x 6 = 12 යි)

03. (i) **කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය**

ස්ථාවර සාධක මත විචල්‍ය සාධක වැඩිකරමින් නිෂ්පාදනයේ යෙදෙන විට එක්තරා මට්ටමකින් පසු ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව හීනවීමට පටන් ගනියි. එය හීනවන ආන්තික ඵලනීතිය යනුවෙන් හඳුනාගත හැකිවේ. (ලකුණු 02)

**දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය**

නිෂ්පාදන ක්‍රියාවලියක සියලුම යෙදවුම් වෙනස් කරන විට නිමැවුම් වෙනස් වන්නේ පරිමාණානුකූල ඵලනීතිය අනුවය. ඒ තුළින් වන්නේ වැඩිවන පරිමාණානුකූල ඵල, ස්ථාවර පරිමාණානුකූල ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල සහිතව නිමැවුම් ඉහළ යාමයි. (ලකුණු 02)

(ii) **කෙටිකාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය** නිෂ්පාදන ක්‍රියාවලියේ නිමැවුම ප්‍රසාරණය කරයි. මුලදී AVC පහත වැටෙන අතර අවම ලක්ෂ්‍යයක් කරා පැමිණ නැවත ඉහළ යයි. ඊට හේතු වන්නේ හීනවන ආන්තික ඵලදා නීතියයි. ආන්තික ඵලදාව ඉහළ යන විට AVC පහළ යන අතර ආන්තික ඵලදාව පහළ යන විට AVC ඉහළ යයි. (ලකුණු 02)

**දිගුකාලීන සාමාන්‍ය පිරිවැය** නිමැවුම ප්‍රසාරණය කරන විට මුල් අවධියේදී LRAC පහත වැටෙන අතර පසුව ඉහළ යයි. පරිමාණානුකූල පිරිමැසුම් ක්‍රියාත්මක වන විට LRAC පහත වැටෙන අතර පරිමාණානුකූල නොපිරිමැසුම් ක්‍රියාත්මකවන විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ යයි. (ලකුණු 02)

(iii) **ඒකාධිකාරී** ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට ඉහළ සිට පහළට බෑවුම් වේ. ඊට හේතුව වන්නේ අපූර්ණ තොරතුරුය. අපූර්ණ තොරතුරු මත ආයතනයට මිල විශේෂිකරණය කිරීමේ හැකියාවක් ඇති වේ. එම නිසා ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ. (ලකුණු 02)

**පූර්ණ තරගකාරී වෙළෙඳපොළ** ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. ඊට හේතු වන්නේ පූර්ණ තොරතුරු, සමජාතීය භාණ්ඩ, අතිවිශාල සැපයුම්කරුවන් සිටීම නිසා **මිල ගණුවෙකු** වශයෙන් සෑම ආයතනයක් ම කටයුතු කිරීමයි. (ලකුණු 02)

5 වන පිටුව බලන්න

(iv)




(රූප සටහනට ලකුණු 02)

මෙහි P මිලේ දී මුළු ආදායමෙන් මුළු විචල්‍ය පිරිවැය ආවරණය වන බව පෙනී යයි. එවිට අලාභ ලබන්නේ ස්ථාවර පිරිවැයෙන් පමණි. ආයතනය වසා දැමුවද ස්ථාවර පිරිවැය පාඩුවක් වන නිසා, තවදුරටත් මෙහිදී ආයතනය පවත්වා ගෙන යාම සුදුසු වේ. නමුත් තවදුරටත් මිල පහළයාමක් හෝ විචල්‍ය පිරිවැය ඉහළ යාමක් සිදුවුවහොත් සිය ආදායමෙන් විචල්‍ය පිරිවැයවත් ආවරණය කර ගත නොහැකි වන නිසා ආයතනය වසා දමනු ලබයි. (ලකුණු 02)

(v)

| ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළ | ඒකාධිකාරී වෙළෙඳපොළ |
|---|---|
| • සැපයුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.<br>• අබාධ පිවිසුමක් හා පිටවුමක් පැවතීම.<br>• එකිනෙකට වෙනස් ප්‍රභේදිත භාණ්ඩ පැවතීම.<br>• ආයතන විසින් ප්‍රචාරණයක් කරයි. | • එක් සැපයුම්කරුවෙකු පමණි.<br>• පිවිසුම සඳහා කෘතිම හෝ ස්වභාවික බාධක පැවතීම.<br>• සුවිශේෂ නිෂ්පාදනයකි.<br>• ආයතන හඳුන්වාදීමට සීමා වූ ප්‍රචාරණයක් කරයි. |

(ලකුණු 04)

04. (i) රජයේ නිෂ්පාදිතයේ වටිනාකම ඇස්තමේන්තු කරනුයේ ඒවායේ නිෂ්පාදන පිරිවැය පදනම් කර ගනිමිනි.

පිරිවැය ඇස්තමේන්තු කරනු ලබන්නේ
(අ) සේවකයන්ට ගෙවන ලද වැටුප
(ආ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ වියදම්
(ඇ) ප්‍රග්ධනය ක්ෂය වීම තක්සේරු කිරීමෙනි (ලකුණු 03)

(ii) 1. දළ දේශීය නිෂ්පාදනය = දළ දේශීය වියදම + ශුද්ධ අපනයනය
1200 = 1800 + ශුද්ධ අපනයනය
1200 - 1800 = ශුද්ධ අපනයනය
- 600 = ශුද්ධ අපනයනය (ලකුණු 01)

2. වැය කළ හැකි ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ සාධක ආදායම + විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම
= 1200 + (-800) + 900
= 1300 (ලකුණු 01)

3. දළ දේශීය ඉතුරුම් = දළ දේශීය නිෂ්පාදිතය - පරිභෝජනය
= 1200 - 600
= 600 (ලකුණු 02)

4. ජාතික ඉතුරුම් = වැය කළ හැකි ජාතික අදායම - පරිභෝජනය
= 1300 - 600
= 700 (ලකුණු 01)

5. වර්තන ගිණුමේ ශේෂය = ශුද්ධ අපනයන + වි.ශු.සා.ආ. + වි.ශු.ව.සංක්‍රාම
= (-600) + (-800) + 900
= -500 (ලකුණු 01)

6. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය = $\frac{\cancel{1200}}{\cancel{120}} \times 100 = 1000$

ආර්ථික වර්ධන අනුපාතය = ( අදාළ වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය − පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ) / පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය

$= \frac{(1000 - 900)}{900} \times 100$

$= 11.1\%$

(iii) ★ වෙළෙඳ පොළේ දෙවන වරට අළෙවි වන භාණ්ඩ
★ අන්තර් භාණ්ඩ මත කරන වියදම්
★ මූල්‍ය පත්‍රිකා ආශ්‍රිත ගනු දෙනු
★ සංක්‍රාම වියදම් (එකකට 1 බැගින් ලකුණු 03)

(iv) එකතු කළ අගය ගණනය කරන්නේ
නිමැවුම - යෙදවුම මගින්
ඒ අනුව එකතු කළ අගය තුළ පවතින්නේ
සාධක සඳහා ගෙවීම් (වැටුප්, පොළී, බදු කුලී, ලාභ) සහ ප්‍රාග්ධන ක්ෂයවීම් වේ.
ආදායම් ක්‍රමයට ගණනය කරනු ලබන්නේ ද සාධක සඳහා ලැබීම්වලිනි. (වැටුප්, පොළී,බදු කුලී, ලාභ) මේ නිසා මෙම ක්‍රම දෙක තුළම පවතින්නේ සාධක ආදායම වේ. එබැවින් මෙම ප්‍රකාශයට එකඟවිය හැක. (ලකුණු 03)

(v) ● මූර්ත දළ ජාතික නිෂ්පාදිතය යනු, ස්ථාවර මිලට ගණනය කරන ලද නිෂ්පාදිතයේ වටිනාකමයි. එය තුළ උද්ධමන හෝ අවධමන තත්ත්වයන් අන්තර්ගත නොවේ.
● මූර්ත ජාතික ආදායම යනු, වෙළෙඳ අනුපාතිකයේ බලපෑම ගළපන ලද මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකමයි.
● මූර්ත ජාතික නිෂ්පාදිතය සහ මූර්ත ජාතික ආදායම අතර වෙනස මගින් නිරූපණය වන්නේ වෙළෙඳ අනුපාතිකය මගින් අපනයනවලට සිදුවූ බලපෑම වේ.

මූර්ත ජාතික ආදායම = මූර්ත දළ ජාතික නිෂ්පාදනය + අපනයනවල ක්‍රය ශක්තිය − ස්ථාවර මිල යටතේ අපනයන වටිනාකම
(ලකුණු 03)

05. (i) ● වැය කළ හැකි ආදායමේ වෙනස හා පෞද්ගලික පරිභෝජනයේ වෙනස අතර අනුපාතික සම්බන්ධය ආන්තික පරිභෝජන නැමියාව වේ.

$$MPC = \frac{\Delta C}{\Delta Yd}$$
(ලකුණු 01)

● වැය කළ හැකි ආදායමේ වෙනස හා පෞද්ගලික ඉතුරුම්වල වෙනස අතර අනුපාතික සම්බන්ධය ආන්තික ඉතුරුම් නැමියාව වේ.

$$MPS = \frac{\Delta S}{\Delta Yd}$$
(ලකුණු 01)

● සරල ආර්ථිකයක වැය කළ හැකි ආදායම යොදවන්නේ පරිභෝජනයට සහ ඉතුරුම්වලටය. එම නිසා ආදායමේ වෙනස් වීම පරිභෝජනයේ වෙනස හා ඉතුරුම්වල වෙනසට සමානවේ. මේ අනුව

$$C + S = Yd$$
$$\frac{\Delta C}{\Delta Yd} + \frac{\Delta S}{\Delta Yd} = \frac{\Delta Yd}{\Delta Yd}$$
$$MPC + MPS = 1$$
(ලකුණු 02)

(ii) ජාතික ආදායම ඉහළට හෝ පහළට වෙනස් නොවී පවත්නා මට්ටමෙහිම රඳා පවත්නා අවස්ථාව ජාතික ආදායමේ සමතුලිත මට්ටමය.

ඒ සඳහා අවශ්‍ය කොන්දේසි (ලකුණු 02)

1) සමස්ත ආදායම = සමස්ත වියදම

$Y = C + I + G$ (ලකුණු 01)

2) සමස්ත විදීම් = සමස්ත කාන්දුවීම්

$J = W$ (ලකුණු 01)

$I + G = S + T$

(iii)




$Y_1$ ආදායම් මට්ටමේදී $Y < E$ බැවින් තොග ඌනතාවක් ඇතිවේ. නිමැවුම ප්‍රසාරණය කරනු ලැබේ.

$Y_3$ ආදායම් මට්ටමේදී $Y > E$ බැවින් තොග අතිරික්ත ඇති බැවින් නිමැවුම සංකෝචනය වේ.

$Y_2$ නිමැවුම් මට්ටමේදී $Y = E$ බැවින් තොග ශූන්‍ය වන අතර නිමැවුම සමතුලිත වේ. (ලකුණු 04)

(iv) (අ) $Y = E$

$Y = C + I + G$

$Y = 180 + 0.8\,yd + 120 + 160$

$Y = 180 + 0.8\,(Y - 100) + 120 + 160$

$Y = 460 + 0.8\,y - 80$

$Y = 380 + 0.8\,y$

$Y - 0.8\,y = 380$

$0.2\,y = 380$

$$y = \frac{380}{0.2}$$

$y = 1900$ හෝ

$W = J$

$S + T = I + G$

$-180 + 0.2\,yd + 100 = 120 + 160$

$-180 + 0.2\,(y - t) + 100 = 280$

$-180 + 0.2\,(y - 100) + 100 = 280$

$-100 + 0.2\,y = 280$

$0.2\,y = 380$

$y = 1900$ (ලකුණු 02)

(ආ) බදු ගුණකය

$$K_T = \frac{-b}{1-b}$$

$$\frac{-0.8}{(1-0.8)}$$

$$\frac{-0.8}{0.2}$$

$-4$

රජයේ වියදම් ගුණකය

$$K_T = \frac{1}{1-b}$$

$$\frac{1}{1-0.8}$$

$$\frac{1}{0.2}$$

$5$ (ලකුණු 02)

(v)




(ලකුණු 02)

- රටක පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුමට වඩා සැබෑ සමාහාර ඉල්ලුම ඉහළ යාම හේතුකොට ගෙන මිල මට්ටම ඉහළ යාම උද්ධමන පරතරය ලෙස හැඳින්වේ. ඉහත රූප සටහනේ A - B පරතරය මගින් එය දැක්වේ.
- රටක පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වා ගැනීමට අවශ්‍ය සමාහාර ඉල්ලුමට වඩා සැබෑ සමාහාර ඉල්ලුම පහළ මට්ටමක පවතින විට රටේ සම්පත් ඌන භාවිතය, සේවා වියුක්ති පරතරය මගින් නිරූපනය වේ. එය ඉහත රූප සටහනේ $Y_F - Y_1$ මගින් දැක්වේ. (ලකුණු 02)

06. (i)
- විනිමය මාධ්‍යයක් වීම.
- වටිනාකමේ මිනුමක් වීම.
- වටිනාකමේ සන්නිධියක් වීම.
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම. (ලකුණු 04)

(ii) (අ) බැංකුවේ අධි සංචිත ප්‍රමාණය = 200 - (1800 x 10/100)
= 200 - 180
= 20 (ලකුණු 02)

(ආ) බැංකුවේ ශේෂ පත්‍රය

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 1820 | සංචිත | 200 |
| | | ණය | 1620 |
| | 1820 | | 1820 |

(ලකුණු 02)

තැන්පතු නිවැරදිව දැක්වීමට ලකුණු 01
ණය නිවැරදිව දැක්වීමට ලකුණු 01

(ඇ) ගැළපුම් කිරීමෙන් පසු ශේෂ පත්‍රය

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| තැන්පතු | 1800 | සංචිත | 180 |
| | | ණය | 1620 |
| | 1800 | | 1800 |

තැන්පතු නිවැරදිව දැක්වීමට ලකුණු 01
ණය නිවැරදිව දැක්වීමට ලකුණු 01 (ලකුණු 02)

(iii) (අ)
- මහජනයා සතු ව්‍යවහාර මුදල් $C_p$
- වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් $C_{KB}$
- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගනු ලබන සංචිත RR
- රාජ්‍ය නියෝජ්‍යාත්ව ආයතන මහ බැංකුවේ පවත්වා ගනු ලබන තැන්පතු $DG_{oi}$ (ලකුණු 02)

(ආ) මුදල් ගුණකය අවම වශයෙන් 1 විය යුතුය. මක් නිසාද මුදල් සැපයුම තුළ අඩුම තරමින් මුදල් පදනමවත් අන්තර්ගත විය යුතු බැවිනි. නමුත් මුදල් මවන විට මුදල් සැපයුම, මුදල් පදනමට වඩා ඉහළ යයි. එහි දී මුදල් ගුණකය 1 ට වඩා වැඩි අගයකි. (ලකුණු 02)

(iv)
- පොළී අනුපාතික පහළ දැමීම.
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමීම.
- විවට වෙළඳපොළෙන් සුරැකුම් පත් මිළදී ගැනීම. (ප්‍රති විකුණුම්) (ලකුණු 03)

(v) යෙදවුම් මිල ඉහළ යාම නිසා සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන් වීම මත මිල මට්ටම ඉහළ යාම පිරිවැය උද්ධමනය වේ. ඊට ප්‍රධාන හේතු කිහිපයක් බලපායි.
(i) වෘත්තීය සමිති බලපෑම් මත වැටුප් ඉහළ නංවා ගැනීම.
(ii) කතිපයාධිකාරි ආයතන සිය ලාභ ආන්තික ඉහළ නංවා ගැනීම.
(iii) සැපයුම් කම්පන මගින් පිරිවැය ඉහළ යාම. (ලකුණු 03)

07. (i) පොදු සේවා සැපයීමෙහි ලා ආණ්ඩුව වෙත පැවරී ඇති වගකීම වඩාත් සාර්ථක ලෙස ඉටු කිරීමේ අරමුණින් පෞද්ගලික අංශයේ සහාය ඒ සඳහා ලබා ගැනිමට භාවිත කෙරෙන ක්‍රමවේදය "PPP (Public Private Partnership)" ක්‍රමය නම් වේ. මෙය BOO, BOT, BOOT, ලෙස විවිධ ස්වරූපවලින් යුක්ත වේ. (ලකුණු 02)

**PPP වල වාසි**
1. රජයේ ණය සීමා කර ගැනීමට හැකිවීම.
2. කාර්යක්ෂමතාව ඉහළ යාම.
3. ව්‍යාපෘතිවල ඵලදායීතාව හා ගුණාත්මකභාවය වැඩි දියුණු වීම.
4. දියුණු තාක්ෂණය ලබාගත හැකි වීම.

(එක් කරුණකට 1 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02)

(ii)
1. ආදායම හා ධනය බෙදීයාමේ විෂමතා අවම කිරීම.
2. කාර්යක්ෂමව සම්පත් කළමණාකරණය කිරීම.
3. ඉහළ සමාජ පිරිවැයක් ගෙන දෙන සමහර පරිභෝජනයන් අධෛර්යමත් කිරීම.
4. සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම. (පරිභෝජන ඉල්ලුම සහ ආයෝජන ඉල්ලුම මේ මගින් කළමණාකරණය කළ හැක)
5. සමාහාර සැපයුම කෙරෙහි බලපෑම. (බදු සහන, බදු විරාම ආදිය තුළින් සමාහාර සැපයුම දිරිමත් කළ හැකි වේ.)
6. ගෙවුම් ශේෂ ගැටළු අවම කර ගැනීම. (ලකුණු 04)

(iii) වර්තන වියදම
1. භාණ්ඩ හා සේවා වියදම
2. වර්තන සංක්‍රාම
3. රාජ්‍ය ණය පොළී ගෙවීම් (ලකුණු 02)

ප්‍රාග්ධන වියදම
1. මූර්ත වත්කම් අත්පත් කරගැනීමේ වියදම්
2. ප්‍රාග්ධන සංක්‍රාම
3. ශුද්ධ ණය දීම් (ලකුණු 02)

(iv)
| | | | |
|---|---|---|---|
| (අ) | වර්තන ගිණුමේ ශේෂය | = | -3500 |
| (ආ) | සමස්ත ශේෂය | = | -9000 |
| (ඇ) | ප්‍රාථමික ගිණුමේ ශේෂය | = | -8500 |
| (ඉ) | රාජ්‍ය පරිභෝජනය | = | 15000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | වර්තන ගිණුමේ ශේෂය | = | මුළු ආදායම | - | පුනරාවර්තන වියදම |
| (ආ) | සමස්ත ශේෂය | = | මුළු ආදායම + ප්‍රදාන | - | මුළු වියදම |
| (ඇ) | ප්‍රාථමික ගිණුමේ ශේෂය | = | මුළු ආදායම + ප්‍රදාන | - | රාජ්‍ය ණය පොළී හැර මුළු වියදම |
| (ඉ) | රාජ්‍ය පරිභෝජනය | = | වර්තන වියදම | - | (රාජ්‍ය ණය පොළී + වර්තන සංක්‍රාම) |

(ලකුණු 04)

(v) ★ රාජ්‍ය ණය ආපසු ගෙවීමේ කොන්දේසි නැවත වෙනස් කිරීමේ සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ගැලපීම් සිදු කිරීමේ කිසිදු අවශ්‍යතාවක් ඇති නොවන පරිදි රටකට තම වර්තමාන සහ අනාගත ණය සේවා කරන වගකීම් සපුරාලීමට ඇති හැකියාව රාජ්‍ය ණය තිරසාරභාවය ලෙස හැඳින්වේ. (ලකුණු 02)

★ ඒ සඳහා යොදා ගන්නා ප්‍රධාන දර්ශකය වන්නේ රාජ්‍ය ණය සේවා අනුපාතයයි. මෙය දළ දේශීය නිෂ්පාදිතයේ, රාජ්‍ය ආදායමේ හෝ රාජ්‍ය වියදමේ ප්‍රතිශතයක් ලෙස දැක්විය හැක.

$$\text{රාජ්‍ය ණය සේවා අනුපාතය} = \frac{\text{දේශීය හා විදේශීය ණය වාරික ආපසු ගෙවීම් හා ඊට අදාළ පොළී}}{\text{දළ දේශීය නිෂ්පාදිතය}} \times 100$$

★ ප්‍රවණතා
2010 = 14.6%
2011 = 13.7%
2012 = 13.4% (ලකුණු 02)

08. (i) (අ) "නිරපේක්ෂ වාසිය බලනුයේ කිසියම් ආර්ථික ඒකකයකට සාපේක්ෂව අඩු පිරිවැයකින් කරනු ලබන නිෂ්පාදනය සම්බන්ධවයි. ඒ අනුව පිරිවැය අඩුවෙන් හෝ කාර්යක්ෂමතාව වැඩි නිෂ්පාදන භාණ්ඩය විශේෂීකරණය කොට ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ කරයි.

නමුත් සාපේක්ෂ වාසි න්‍යාය ආවස්ථික පිරිවැය පදනම් කර ගනිමින් තීරණ ගනී. ඒ අනුව අනෙක් රටට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් යුත් භාණ්ඩය විශේෂීකරණය කොට ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වේ. (ලකුණු 03)

(ආ) (1) පූර්ණ සාධක සංචලතාව
(2) ස්ථාවර පරිමාණානුකූල ඵල
(3) නිෂ්පාදනය හෝ පරිභෝජනය ආශ්‍රිතව බාහිරතා හට නොගනී.
(4) ප්‍රවාහන පිරිවැය සැලකිල්ලට නොගැනේ.

(එක් කරුණකට 1 බැගින් උපරිම 2)

(ii) (අ)
- ළදරු කර්මාන්ත ආරක්ෂා කරගත හැකිවීම.
- ස්ථායිතාව සඳහා විවිධාංගීකරණය වීමේ අවශ්‍යතාව
- ප්‍රපාතනය වැළැක්වීම
- සේවා නියුක්තිය ආරක්ෂා කර ගැනීම
- ජාතික ආරක්ෂාව
- ස්වයංපෝෂිත බව
- ගෙවුම් ශේෂ ගැටළු අවම කරගත හැක

(කරුණකට 1 බැගින් ලකුණු 02)

(ආ)
- සලාක හෙවත් කෝටා නියම කිරීම
- දේශීය නිෂ්පාදන සඳහා සහනාධාර හෝ දිරිගැන්වීම් ලබාදීම
- විදේශ විනිමය පාලනය කිරීම
- ආනයන/අපනයන සීමා පැනවීම
- වෙළෙඳ සම්බාධක පැනවීම
- පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම

(එක් කරුණකට 1 බැගින් ලකුණු 02)

(iii) සමාගම් කොටස්, පිළිණපත්, ණයකර, මුදල් වෙළෙඳපොළ ණය උපකරණ, මූල්‍ය ව්‍යුත්පන්නයන් යනාදිය ආශ්‍රිත වත්කම් හා වගකීම් අත්කර ගැනීම කළඹ ආයෝජනය වේ. (ලකුණු 01)

සෘජු ආයෝජනය යනු, දේශීය නිෂ්පාදන ව්‍යාපාර තුළ, විදේශීයන් කරනු ලබන ආයෝජනය වේ. (ලකුණු 01)

කළඹ ආයෝජන මෙන් නොව, විදේශ සෘජු ආයෝජන සමග මානව ප්‍රාග්ධනය, තාක්‍ෂණය හා කළමනාකරණය ආදිය ද ලැබේ. තවද දේශීය සේවා නියුක්තිය ඉහළයාම, කර්මාන්ත අතර ඉදිරිපස හා පසුපස සම්බන්ධතා ගොඩනැගීම රටක ආර්ථික වෘද්ධියට ඉතා වැදගත් වේ. (ලකුණු 02)

(iv) 1. සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම
2. අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
3. අපනයන විවිධාංගිකරණය
4. විදේශ රටවල් සමග වෙළෙඳ ගිවිසුම ඇති කිරීම
5. ආනයන ආදේශන කර්මාන්ත ඇති කිරීම
6. දේශීය මුදල් ක්‍ෂය වීමට ඉඩ හැරීම හෝ අව ප්‍රමාණය කිරීම
7. දේශීය උද්ධමනය පාලනය කොට අපනයන තරගකාරිත්වය ඉහළ නැංවීම
8. අත්‍යවශ්‍ය ආනයන හැර අවශේෂ ආනයන අධෛර්යමත් කිරීමට කටයුතු කිරීම

(එක් කරුණකට 1 බැගින් ලකුණු 03)

(v)
- ශ්‍රී ලංකාව මැදි ආදායම් ලාභී රටක් වීම නිසා සහනදායි ණය ලබාගැනීම වෙතින් සහනදායි නොවන ණය කරා විතැන් වීම
- බටහිර ද්වි පාර්ශවීය ණය හා යුරෝපා හවුලෙන් ලැබෙන සහනදායි ණය අඩුවී ඒ වෙනුවට වාණිජ ණය ප්‍රධාන ස්ථානයක් ගැනීම
- සහන ණය සීමාවීම නිසා රජය අවු. 15 පමණ පරිනත කාලයක් සහිත දිගුකාලීන ණය අරමුදල්, මූල්‍ය, වෙළෙඳ පොළ ඔස්සේ සපයා ගැනීම
- කෙටි කාලීන ණය මූලාශ්‍ර වෙත යොමුවීමට සිදුවීම ඒ නිසා පොළී පිරිවැය ඉහළයාම (ලකුණු 04)

09. (i) (අ)
- ආවස්ථික පිරිවැය ලෙස වර්තමාන පරිභෝජන කැප කිරීම.
- පාරිසරික හායනය.
- මිල උද්ධමනය.
- ආදායම් ව්‍යාප්ති විෂමතා හට ගැනීම. (ලකුණු 03)

(ආ) - ආර්ථික සංවර්ධනය වූ කලී පරිණාමන ක්‍රියාවලියකි.
එනම් ප්‍රමාණාත්මක, ගුණාත්මක හා ව්‍යුහාත්මක යන ස්වරූපවල වෙනස්වීම් ආර්ථික සංවර්ධනය ලෙස සැලකේ. (ලකුණු 02)

- ආර්ථික සංවර්ධනය සඳහා පහත සඳහන් ව්‍යුහාත්මක වෙනස්කම් සිදුවිය යුතුය.
    - කාර්මීකරණය වේගවත් වීම.
    - කෘෂි අංශයේ සාපේක්‍ෂ දායකත්වය අඩුවීම.
    - වෙළෙඳ රටාවේ වෙනස්වීම්.
    - නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව ඉහළ යාම
    - නවීකරණය

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02)

(ii) - මානව දරිද්‍රතාව යන්නෙන් අදහස් කරන්නේ නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්න සතුටුදායක ජීවන තත්ත්වයක් සාක්‍ෂාත් කරගැනීමට අදාළ මානව සංවර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා සහ තේරීම් අහිමි වී ගිය තත්ත්වයකි. (ලකුණු 02)

- මානව සංවර්ධනය යනු දීර්ඝායුෂ සහිත නිරෝගී ශිෂ්ට සම්පන්න ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන සම්පත් සඳහා ප්‍රවේශ වීමට ඉඩ සලසන හා තේරීමේ පරාසය මෙන්ම හැකියාවන් පුළුල් කිරීමේ ක්‍රියාවලියකි. (ලකුණු 01)

ඉහත නිර්වචනයන්ට අනුව පැහැදිලි වන්නේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් කරා වෙනස්වීම මානව සංවර්ධනය බවයි. මෙහිදී ප්‍රධාන නිර්ණායක ලෙස ගැනෙන්නේ
- යහපත් ජීවිතයකට අවශ්‍ය කරන ද්‍ර
- සෞඛ්‍ය තත්ත්වය
- ආරක්‍ෂාව
- තේරීමේ නිදහස
- සමාජ සම්බන්ධතා ආදියයි. (ලකුණු 01)

(iii) (අ) i දීර්ඝායුෂ (සෞඛ්‍යය)
ii දැනුම (අධ්‍යාපනය)
iii යහපත් ජීවන තත්ත්වය (ලකුණු 03)

(ආ) i සෞඛ්‍යය
ii අධ්‍යාපනය
iii ජීවන තත්ත්වය (ලකුණු 03)

(iv) (i) - ග්‍රාමීය මාර්ග සංවර්ධනය (මග නැගුම)
- ග්‍රාමීය විදුලි බල සංවර්ධනය
- කුඩා වාරි මාර්ග නවීකරණය
- ග්‍රාමීය අංශය තුළ තොරතුරු තාක්‍ෂණය ප්‍රවර්ධනය
- මාර්ග ජාලය, වරාය හා ගුවන් සේවා සහ කුඩා නගර සංවර්ධනයට ප්‍රමුඛතාව දීම
- දිවි නැගුම වැඩ සටහන
- ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන් (උතුරු වසන්තය, පුබුදමු වෙල්ලස්ස, නැගෙනහිර නවෝදය)
(ලකුණු 03)

10. (i) සෞභාග්‍ය දර්ශකය (ලකුණු 01)

| **වර්ෂය** | **සෞභාග්‍ය දර්ශකය** |
|---|---|
| 2011 | 62.5 |
| 2012 | 66.8 |

(ලකුණු 02)

(ii) - ද.දේ.නි. ඇමරිකානු ඩොලර් බිලියන 185 දක්වා ඉහළ නැංවීම
- සේවා වියුක්තිය 3% දක්වා අඩු කිරීම
- දරිද්‍රතාව 2% දක්වා අඩු කිරීම (ලකුණු 03)

(iii) - ශ්‍රී ලංකාව පිළිබඳ ගෝලීය ආකල්ප ශුභදායි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- සංචාරක ආකර්ෂණයකින් යුත් ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධාංගීකරණය වූ පුළුල් වෙළෙඳ පොළක් බිහිකිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීම.
- වැඩිවන ඉල්ලුම සපුරාලිය හැකි පරිදි සංචාරක හෝටල් ඉදිකිරීම.
- සංචාරක කර්මාන්තය හා බැඳුනු නොවිධිමත් අංශය විධිමත් කිරීමට උපාය මාර්ග සැලසුම් කිරීම.
- සංචාරක ආකර්ෂණයකින් යුත් ස්ථාන මැනවින් නඩත්තු කිරීම හා සංවර්ධනය.
- දුම්රිය සේවය, මාර්ග පද්ධති හා ගුවන් තොටුපල පහසුකම් සංවර්ධනය කිරීම.
- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මනාව තේරුම් ගතහැකි ශ්‍රම හමුදාවක් පුහුණු කිරීම. (ලකුණු 04)

(iv) ඉහළ සාධන මට්ටමක් අත්පත් කර ගෙන ඇත.
- 2000 වර්ෂයේ ඉදිරිපත් වූ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ, 2015 වන විට සාධනය කරගත යුතුය. එම අභිමතාර්ථයන් අතර අන්ත දිළිඳු බව මුලිනුපුටා දැමීම වැදගත් එකකි.
- ශ්‍රී ලංකාව 2000 වසරේ සිට 2013 වසර වන විට දරිද්‍රතාව සැලකිය යුතු ලෙස පහළ දමා ඇත.

| වර්ෂය | ජනගහන දරිද්‍රතා අනුපාතිකය |
|---|---|
| 2002 | 22.7 |
| 2006/7 | 15.2 |
| 2009/10 | 8.9 |

(ලකුණු 04)

(v) දිවි නැගුම වැඩ සටහනේ මූලික අරමුණු හතරකි.
(i) පවුලේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
(ii) පවුලේ දෛනික ජීවන වියදම අඩු කිරීම.
(iii) පවුලේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම.
(iv) පවුල් සඳහා අමතර ආදායම් මාර්ග බිහිකිරීම. (ලකුණු 02)

**ක්‍රියාත්මක වන ආකාරය**

ප්‍රථම අදියර : "ඉසුරුමත් නිවහනක් - අසිරිමත් මව්බිමක්" තේමාව යටතේ ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් ආරම්භ කිරීම.

දෙවන අදියර : එළවළු බීජ, පළතුරු පැළ සහ අනෙකුත් වාණිජමය බෝග යනාදිය ලබාදීමෙන් ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂ 2.1කට ප්‍රතිලාභ ලබාදීම.

තෙවන අදියර : ගෘහ ආර්ථික ඒකක 2.5කට ප්‍රතිලාභ සලසමින් පශුසම්පත් ගොවිපොළ, ගබඩා පහසුකම්, සුළු පරිමාණ වී මෝල් සහ ආහාර සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ගමකට පවුල් 200 බැගින් වූ දිවි නැගුම ව්‍යවසාය ගම්මාන පිහිටුවීම.

සිව්වන අදියර : බීජ කට්ටල සහ පළතුරු, පොල්, සුළු අපනයන බෝග සහ ඖෂධීය පැළ ලබාදීම. ඉඩම් අක්කර 1/4 සිට 2 1/2 දක්වා ඇති පුද්ගලයන්ට වාණිජ බෝග වගා කිරීමට සහාය ලබාදීම. ප්‍රතිලාභීන් සංඛ්‍යාව මිලියන 5ක් වූ අතර රු. බිලියන 5.9ක් ව්‍යාපෘතිය සඳහා වැය කරන ලදී.

2013 දී දිවි නැගුම පනත සම්මත කර ගැනීම මගින් දිවි නැගුම ජාතික වැඩ සටහන සඳහා නීතිමය රාමුවක් සැකසීම.

සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ කර දිවි නැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීම. (ලකුණු 04)